| රු. 100,001 සිට 500,000 දක්වා | 250 0 |
| රු. 500,001 සිට 1,000,000දක්වා | 500 0 |
| රු. 1,000,000ට වැඩි | 1,000 0 |

09 - 669/9

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - x යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා වන සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වන බද්ද සභා බලප්‍රදේශයේ එකී බද්දට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - සංවර්ධනය නොකළ ඉඩම් සඳහා වන බදු පැනවීම**

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු ඉඩමක,

1. ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්; හෝ
2. ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ
3. ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලි වලට ඇත්ත වශයෙන්ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1/20 ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධන නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමිය ප්‍රාග්ධන අගයෙන් සියයට දශම 0.1%ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි යෝජනා කරමි.

09 - 669/10

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2019 වර්ෂය සඳහා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හා අනුමත කර ඇත්තා වූ හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල් වලින් ගාස්තු අයකිරීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හා අනුමත කර ඇත්තා වූ හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල්වලින් ගාස්තු සභා බලප්‍රදේශයේ එකී බද්දට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හා අනුමත කර ඇත්තා වූ හෝටල්, ආපන ශාලා හා ලැගුම්හල්වලින් ගාස්තු අය කිරීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් හෝටලයක්, ආපල ශාලාවක් හෝ ලැගුම් ශාලාවක් වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ ද, ඒ හෝටලය, ආපන ශාලාව හෝ ලැගුම්හල (1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යය සඳහා) ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ අවස්ථාවක එම හෝටලය, ආපන ශාලාව හෝ ලැගුම්හල එම වර්ෂයට පෙර වූ වර්ෂය සඳහා වූ ලැබීම්වලින් සියයට එකක් (1%) ගාස්තුවක් එම හෝටලය, ආපන ශාලාව හෝ ලැගුම්හල පවත්වාගෙන යනු ලබන අය විසින් කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත 2019 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් එම හෝටලය, ආපන ශාලාව හෝ ලැගුම්හල ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන විට එම ස්ථානය වාර්ෂික වටිනාකම අනුව නියම කරනු ලබන ගාස්තුවක් පනවා අය කිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

09 - 669/11

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම පිළිබඳ ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා සංචාරක වෙළෙඳාම පිළිබඳ ගාස්තු පැනවීම සඳහා වන ගාස්තුව සහා බලප්‍රදේශයේ එකී බද්දට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - 2019 වර්ෂයට සංචාරක වෙළඳාම පිළිබඳ ගාස්තු පැනවීම**

වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළකරන ලද 2011.01.18 වැනි දින වයඹ පළාත් සභා රැස්වීමේ දී ස්ථිර කරන ලද බව 2011.04.28 වැනි දිනැති අංක 1703/18 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සංචාරක වෙළෙඳාම් සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ යුතු බව එකී අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2019 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය 01*

| *අනු අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | ගාස්තුව *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රුපියල් 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රුපියල් 750.00 ඉක්මවන එහෙත් රුපියල් 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත* | *රුපියල් 1500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත* |
| 1. | තැඹිලි කුරුම්බා වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | කඩල, වඩේ, මුරුක්කු බයිට් පැකට් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | රෙදි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | පාවහන් වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු අංකය | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* රුපියල් 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රුපියල් 750.00 ඉක්මවන එහෙත් රුපියල් 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රුපියල් 1500.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 5. | සාප්පු බඩු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මල්පැළ, එළවළු පැල හා පළතුරු පැළ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පොත්, පත්තර වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | එළවළු හා පළතුරු වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කෘත්‍රිම මල් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ජංගම බැංකු සේවා | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පහන්තිර, හඳුන්කූරු ඇතුළු පූජා භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඔරලෝසු වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කරත්තවල පාන්, බනිස් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |

09 - 669/12

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xiii යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම සඳහා වන ගාස්තුව සහා බල ප්‍රදේශයේ එකී ගාස්තුවට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - 2019 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු පැනවීම**

පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාද 1988 අගෝස්තු 23 දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත අතුරු ව්‍යවස්ථා මාලාවේ ප්‍රචාරක දැන්වීම් හා දෘෂ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව පිළිගෙන ක්‍රියාත්මක කරන බව කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ 2000.05.04 වැනි දින මහ සභා රැස්වීමේ ඒකමතිකව සභා සම්මත කර 2000.07.14 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති හෙයින් එම අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කුලියාපිටිය බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත උපලේඛනයේ ගාස්තුව අය කිරීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

**උපලේඛන අංක 01**

*ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු - 2019 වර්ෂය සඳහා :*

| | | *රු. ශත* |
|---|---|---|
| 1. | එක් මසකට වැඩි මාස 03 කට අඩු කාල සීමාවක් සඳහා බැනර්, කටවුට් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 20 0 |
| 2. | ස්ථිර දැන්වීම් පුවරු- වර්ෂයක කාලයක් සඳහා වර්ග අඩියකට | 100 0 |
| 3. | තාවකාලික දැන්වීම් පුවරු - මසක කාලයක් සඳහා වර්ග අඩියකට | 50 0 |

09 - 669/13

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට තාවකාලික වෙළඳ කුටි, වෙළඳසැල් සඳහා ගාස්තු පැනවීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ අගෝස්තු මස 09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xiv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා තාවකාලික වෙළෙඳ කුටි, වෙළෙඳ සැල් සඳහා බදු පැනවීම සඳහාවන ගාස්තුව සභා බල ප්‍රදේශයේ එකී ගාස්තුවට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,<br>
සභාපති,<br>
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,<br>
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - 2019 වර්ෂයට තාවකාලික වෙළඳ කුටි, වෙළඳසැල් සඳහා බදු පැනවීම**

2019 වර්ෂයට අදාලව කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 01 වන උපලේඛනයේ සඳහන් වෙළඳකුටි සඳහා ගාස්තු පනවා අය කල යුතු බවත්, 02 වන උපලේඛනයේ සඳහන් වෙළඳසැල් සඳහා ගාස්තු පනවා අය කළ යුතු බවත් කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛන 01*

*කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක කුටි සඳහා*<br>
**බලපත්‍ර ගාස්තු**

| | |
|---|---|
| එක් දිනකට | රු. 1,000 0 |
| සතියකට | රු. 1,500 0 |
| මසකට | රු. 3,000 0 |

*උපලේඛනය 02*

*තාවකාලික වෙළඳ සැල් බදු*

උත්සව අවස්ථා සඳහා තාවකාලික වෙළඳ සැල් වලින් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

*උපලේඛනය* **- 02**

| | | |
|---|---|---|
| 1. | වර්ග අඩි 1 සිට 5 දක්වා - දිනකට | රු. 25 0 |
| 2. | වර්ග අඩි 6 සිට 10 දක්වා - දිනකට | රු. 50 0 |
| 3. | වර්ග අඩි 11 සිට 15 දක්වා - දිනකට | රු. 75 0 |
| 4. | වර්ග අඩි 16 සිට 25 දක්වා - දිනකට | රු. 100 0 |
| 5. | වර්ග අඩි 26 සිට 50 දක්වා - දිනකට | රු. 125 0 |
| 6. | වර්ග අඩි 51 සිට 100 දක්වා - දිනකට | රු. 150 0 |
| 7. | වර්ග අඩි 101 සිට 150 දක්වා - දිනකට | රු. 175 0 |
| 8. | වර්ග අඩි 151 සිට 200 දක්වා - දිනකට | රු. 200 0 |
| 9. | වර්ග අඩි 201 සිට 300 දක්වා - දිනකට | රු. 300 0 |
| 10. | වර්ග අඩි 301 සිට 400 දක්වා - දිනකට | රු. 400 0 |

| | | |
|---|---|---|
| 11. | වර්ග අඩි 401 සිට 500 දක්වා - දිනකට | රු. 500 0 |
| 12. | ඊට වැඩිවන සෑම අවස්ථාවකදී ම - දිනකට | රු. 700 0 |
| 13. | අයිස්ක්‍රීම් බයිසිකලයක් සඳහා - දිනකට | රු. 100 0 |
| 14. | අයිස්ක්‍රීම් වෑන් රථයක් සඳහා - දිනකට | රු. 500 0 |
| 15. | ජංගම වෙළඳාම කඩ, රස කැවිලි සඳහා - දිනකට | රු. 100 0 |
| 16. | පෞද්ගලික රථගාල් සඳහා - දිනකට | රු. 750 0 |
| 17. | පාපැදි හා යතුරුපැදි ආරක්ෂා කරන ස්ථාන - දිනකට | රු. 500 0 |

09 - 669/14

---

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

2019 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2018.08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xv යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් වන ගාස්තුව සභා බල ප්‍රදේශයේ එකී ගාස්තුවට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - 2019 වර්ෂයට සපයනු ලබන සේවාවන් හා දේපල කුලියට දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම**

2019 වර්ෂය සඳහා කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වත්කම් සඳහා 01 වන උපලේඛනයේ සඳහන් ගාස්තු ද, සේවා සඳහා 02 වන උපලේඛනයේ සඳහන් ගාස්තු ද පනවා අය කළ යුතු බවට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය 01*

| *අනු. අංකය* | *දේපල* | *ගෙවිය යුතු ගාස්තු රු. ශ.* |
|---|---|---|
| 1 | මුදල් අය කරන සංදර්ශන/සේල් පැවැත්වීම සඳහා සභාව සතු ක්‍රීඩා භූමි බදු දීම - දිනකට | 3,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 5,000 0 |
| 2. | මුදල් අය නොකර වෙනත් කටයුතු සඳහා ක්‍රීඩා භූමි බදු දීම - දිනකට | 1,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 2,000 0 |

| | | රු. ශ. |
|---|---|---|
| 3. | සභාව සතු දේපල වෙළඳ කුටියක් පවත්වාගෙන යාමට - දිනකට | 500 0 |
| 4. | ප්‍රජා ශාලාව උත්සව සඳහා දිනකට විදුලි පහසුකම් සහිතව දීම | 8,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල | 3,000 0 |
| 5. | ප්‍රජා ශාලාව සඳහා මුදල් අය නොකරන රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට දිනකට | 5,000 0 |
| | ආපසු ගෙවන ඇප තැන්පත්මුදල | 2,000 0 |

*උපලේඛනය 02*

| *අනු. අංකය* | *සේවා වර්ගය* | | *ගෙවිය යුතු ගාස්තුව* රු. ශත |
|---|---|---|---|
| 01. | වීථි රේඛා සහතිකයක් නිකුත් කිරීමේ ගාස්තුව | | 600 0 |
| 02. | ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු | | 200 0 |
| 03. | බැකෝ යන්ත්‍රය සඳහා පැය 1 කට | | 2,861 0 |
| 04. | ගල් රෝල දිනකට (ලොකු) | | 8,600 0 |
| 05. | ගල්රෝල දිනකට (පොඩි) | | 7,200 0 |
| 06. | ලෝ බෙඩ් රථය (කි.මී. 50ක් ඇතුළත) | | 6,234 50 |
| 07. | වතුර බවුසරය 1 ක් සඳහා | | 1,350 + (50 x 1 K.m.) |
| 08. | ට්‍රැක්ටරය දිනකට | | 4,500 0 |
| 09. | ගලි බව්සරය ලෝඩ් 1 ක් සඳහා | | 1,400 + (75 x 1 K.m.) + 2,600 |
| 10. | ටෙන්ඩර් පෝරම ගාස්තු | ඉඩම් බදු දීම සඳහා | 300 |
| | | අනෙකුත් වත්කම් සඳහා | -1,000 0 |
| 11. | ඉඩම් අනු බෙදුම් පෝරම ගාස්තු | | 250 0 |
| 12. | වෙනත් ඕනෑම සහතිකයක් නිකුත් කිරීම සඳහා ගෙවීම | | 500 0 |
| 13. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු නේවාසිකව වර්ග අඩියකට කොටසක් තනා ඇතිනම් | | - 2 0 |
| | | නව නිවසක් නම් | - 1 0 |
| 14. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු නේවාසික නොවන වර්ග අඩියකට | | රු. 2 0 |
| 15. | ඉඩම් අනු බෙදුම් අනුමත කිරීමේ ගාස්තු | සංවර්ධන සැලසුමට | -500 0 |
| | | කට්ටි සැලසුමට | -500 0 |
| 16. | අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම | | 500 0 |
| 17. | දේපල අයිතිය වෙනස් කිරීම් අයදුම්පත් | | 100 0 |
| 18. | වරිපනම් ලේඛනයට නම ඇතුළත් කිරීම | | 100 0 |
| 19. | පිඹුරුපත් අනුමත කිරීම | | 500 0 |
| 20. | ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රවල කාලය දීර්ඝ කිරීම වසරකට | | 200 0 |
| 21. | පරිසර බලපත්‍ර ගෙවීම | | 1,250 0 |
| 22. | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 500 0 |
| 23. | කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 1,500 0 |
| 24. | අනතුරුදායක ගස් පරීක්ෂාව | | 500 0 |
| 25. | දියර පොහොර ලීටර් 01 ක් | | 5 0 |
| 26. | දුරකතන කුලුණු ඉදිකිරීම සඳහා පෙරසැරි ගාස්තු | උස මීටර් 5 - 50 දක්වා රු. 50,000 හා ඊට වැඩිවන සෑම මීටර් එකකට රු. 500 බැගින් | |
| 27. | හිස් තාර බැරල් විකිණීම | | 100 0 |

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් 2019 වර්ෂයේ 08.09 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 5 - 1 - xvi යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ සඳහා වන ගාස්තුව සභා බල ප්‍රදේශයේ එකී බද්දට යටත් මහජනතාව කුලියාපිටිය ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. විජයසිරි ඒකනායක,
සභාපති,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 06 වැනි දින,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මහා සභා යෝජනාව - 2019 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම**

2019 වර්ෂය සඳහා කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2019 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම 01 වන උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කළ යුතු බවට කුලියාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛන 01*

| *අනු. අංකය* | | *එක් වරක් පමණක් ගෙවන ලියාපදිංචි ගාස්තුව රු. ශත* | *නවතා තැබීමේ වාර්ෂික ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| 01. | කුලී ත්‍රීරෝද රථ සඳහා | 100 0 | 500 0 |
| 02. | මගී ප්‍රවාහන බස්රථ නොවන කුලී වෑන් රථ සඳහා | 100 0 | 700 0 |
| 03. | යතුරු පැදි නවතා තැබීම | දිනක් සඳහා | 20 0 |
| 04. | පා පැදි නවතා තැබීම | දිනක් සඳහා | 10 0 |
| 05. | ත්‍රීවිල්/අත් ට්‍රැක්ටර් නවතා තැබීම | දිනක් සඳහා | 30 0 |
| 06. | ලොරි රථ/වෑන් රථ නවතා තැබීම | දිනක් සඳහා | 50 0 |

09 - 669/16

---

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමේ ස්ථානයක් සඳහා ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2019 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වැනි දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0(i) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගත යුතු වන සෑම කර්මාන්තයක් ම හෝ ව්‍යාපාරයක් ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2019 වර්ෂය සඳහා සභාපතිවරයාගෙන් වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත් එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව ඒ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් තවදුරටත් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන එක් එක් ස්ථානය වෙනුවෙන් 2019 වර්ෂයට තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කරනු ලබන සෑම බලපත්‍රයක් ම මත ඉහත කී යෝජනාවේ සඳහන් ආකාරයෙන් ගාස්තුවක් තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,<br>
සභාපති,<br>
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,<br>
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතෙන් ලැබී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, අංක 1811 දරන 2013.05.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති සහ 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් ලැබී ඇති බලය යටතේ දකුණු පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරනු ලැබූ බවට 2014 අගෝස්තු මස 29 වැනි දින අංක 1878 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හා 2016.11.18 දිනැති අංක 1994 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනය කරනු ලැබූ තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති 2016 ඔක්තෝබර් මස 12 වැන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශ අංක 10/01 අනුව තීරණ අංක 563 පරිදි ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ සඳහන් කිසියම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය හෝ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන් ම එකී කර්මාන්තය හෝ ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම ඒ උපලේඛනයේ 2 වන කොටසේ i වන තීරයේ නිරූපිත ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන හා 149 වන වගන්තිවලින් තංගල්ල ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, 2019 වර්ෂය සඳහා නියම කිරීමට සහ අය කිරීමටත්,

ඉහත I වන කොටසේ සඳහන් කර්මාන්ත අතරින් අංක 9 යටතේ සඳහන් කිසියම් ආපන ශාලාවක් හෝ අංක 10 යටතේ සඳහන් වන කිසියම් හොටලයක් හෝ අංක 11 යටතේ සඳහන් කිසියම් නවාතැන් පොළක් හෝ ඒ ආපනශාලාව, හෝටලය හෝ නවාතැන් පොළ, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියා පදිංචි කර ඇත්තාවූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණද ඒ ආපනශාලාව හෝ හෝටලය හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත්කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ ආපන ශාලාවේ හෝ හෝටලයේ හෝ නවාතැන් පොළෙහි හෝ 2018 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක් (1%) විය යුතු බවත් තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් යෝජනා කරන්නීය.

**උපලේඛනය**

1 වන කොටස

1. මාළු විකිණීම
2. මස් විකිණීම
3. සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
4. කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. බේකරියක් පවත්වාගෙන යාම
6. කිරි පට්ටියක් පවත්වාගෙන යාම

7. පිහිණුම් තටාකයක් පවත්වාගෙන යාම
8. අයිස් කර්මානත ශාලාවක් පවත්වාගෙන යාම
9. බත් කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම
10. හෝටලයක් පවත්වාගෙන යාම
11. නවාතැන් පලක් පවත්වාගෙන යාම
12. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
13. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම
15. සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම
16. ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථානයක් හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථානයක් පවත්වාගෙන යාම

2 වන කොටස

| | *I වන තීරුව* වාර්ෂික වටිනාකම | *II වන තීරුව* බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|---|
| 1. | රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| 2. | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| 3. | රු. 1,500 ඉක්මවන අවස්ථාවක | 1,000 0 |

09 - 709/3

---

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (iii) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද ඒ කර්මාන්ත (වෙළෙඳම්) බද්ද, 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නාවූ කිසියම් කර්මාන්තයක් *නැතහොත්* වෙළෙඳමක් තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂය ඇතුළත දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී කර්මාන්තය හෝ වෙළෙඳාම කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 1 වන තීරයේ නිරූපිත ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි 11 වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත (වෙළෙඳාම්) බද්දක්, 2019 වර්ෂය සඳහා නියම කර අයකිරීමටත්, එකී කර්මාන්ත (වෙළෙඳාම්) බද්දට යටත් සෑම තැනැත්තෙක් ම, එකී කර්මාන්ත (වෙළෙඳාම්) බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය

| | *1 වන තීරුව* වාර්ෂික වටිනාකම | *11 වන තීරුව* ගෙවිය යුතු බද්ද රු. ශත |
|---|---|---|
| 1. | රු. 750 නොඉක්මවන අවස්ථාවක | 500 0 |
| 2. | රු. 750 ඉක්මවන නමුත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 750 0 |
| 3. | රු. 1,500 ඉක්මවන අවස්ථාවක | 1,000 0 |

09 - 709/2

---

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (iv) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද ඒ ව්‍යාපාර බද්ද, 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යාවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත (වෙළෙඳාම්) බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ ද හා වෘත්තියක් නොවන්නා වූ ද කිසියම් ව්‍යාපාරයක් තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2019 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක් ම එකී ව්‍යාපාර බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

**උපලේඛනය**

| | *I* වන තීරුව බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ දී ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | *II* වන තීරුව ගෙවිය යුතු බද්ද රු. ශ. |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නැත |
| 2. | රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| 6. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

09 - 109/1

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා අක්කර බදු නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (vi) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

තව ද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (7) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට කර ඇති නියමයේ ආකාරයට, 2019 වර්ෂය සඳහා නියම කරන ලද ඒ වාර්ෂික අක්කර බද්ද, 2019 වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත්, ඒ වාර්ෂික බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක වට්ටමක් ද, ඒ අක්කර බද්ද වාරිකවලින් ගෙවන අවස්ථාවක නම් ඒ අක්කර බද්දේ වාරිකය අයවිය යුතු යයි යෝජනාවේ දක්වා යම් කාල සීමාවක පළමුවන මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් සියයට පහක වට්ටමක් ද දෙනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව සහ එකී උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ සඳහන් අකාරයෙන් පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් 1989 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරන ලද නියමයෙන් තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නියමය ප්‍රකාර ව, පහත උපලේඛනයේ 1 වන කොටසේ I වන තීරුවේ නිරූපිත යම් ඉඩම් ප්‍රමාණයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක, ඒ එක් එක් ඉඩම් හෙක්ටයාරය මත එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් 2019 වර්ෂය සඳහා නියම කර අය කිරීමටත් සහ ඒ අක්කර බද්ද ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවීමට විධාන කිරීමටත් තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| | *I* වන තීරුව<br>ඉඩම් ප්‍රමාණය | *II* වන තීරුව<br>අක්කර බද්ද<br>රුපියල් |
|---|---|---|
| 1. | ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක | 50 0 |
| 2. | ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන අවස්ථාවක | 10 0 |

09 - 709/4

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ නිවේදනය

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (ii) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221 (අ), 122 හා 126 වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල කොටස් අංක 39 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2019 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| අනු. අංකය | විස්තර | බලපත්‍ර ගාස්තුව රු. ශ. |
|---|---|---|
| 01. | බැනර් වර්ග අඩියට මාසයකට හෝ ඉන් කොටසකට | 25 0 |
| 02. | බැනර් වර්ග අඩියට මාසයකට වැඩි කාලයක් සඳහා | 50 0 |
| 03. | ප්‍රචාරක දැන්වීමක් හෝ පුවරුවක් සඳහා වර්ග අඩියට මාසයකට හෝ ඉන් කොටසකට | 50 0 |
| 04. | ප්‍රචාරක දැන්වීමක් හෝ පුවරුවක් සඳහා වර්ග අඩියට මාසයකට වැඩි කාලයක් සඳහා | 100 0 |

09 - 709/5

---

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂයට අදාළව ඉඩම් විකිණීම මත බදු අය කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (vii) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,

තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයකු හෝ අනුයෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක්, විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

09 - 709/6

---

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (v) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද ඒ සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද, 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වන වගන්තියේ (1) වන උපවගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි කිසියම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක හෝ යුක්ති සහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි වන විටක, එවැනි යම් ඉඩමක -

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් ; හෝ

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක ; හෝ

එකී ඉඩම, සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකෙන ඉඩම් මත 2019 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම දෙක (0.2%) ක වාර්ෂික බද්දක් නියම කිරීමටත්. එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2019 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තංගල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමටත් තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

09 - 709/7

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### 2019 වර්ෂය සඳහා කසළ ඉවත් කිරීමේ ගාස්තු නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (viii) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2019 වර්ෂය සඳහා නියම කරන ලද ඒ කසළ ඉවත් කිරීම සඳහා වූ ගාස්තුව වශයෙන් ගෙවිය යුතු මුදල, එකී ප්‍රාදේශීය සභා පනතේ 159 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඉල්ලා සිටීමෙන් පසුව දින දහහතරක් ඇතුළත එය තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

''1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති කිසියම් වෙළෙඳමක් හෝ කිසියම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානයකින් හෝ කිසියම් රාජ්‍ය ආයතනයකින් හෝ අර්ධ රාජ්‍ය ආයතනයකින් බැහැර කරනු ලබන ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා පහත උපලේඛනයෙහි සඳහන් ආකාරයෙන් ගාස්තු ගෙවිය යුතු බවට නියම කිරීමට තංගල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

1 වන කොටස

සංචාරක හෝටල නොවන්නා වූ ද, කිසියම් වෙළෙඳමක් හෝ ව්‍යාපාරයක් කරනු ලබන ස්ථානයකින් හෝ කිසියම් රාජ්‍ය ආයතනයකින් හෝ අර්ධ රාජ්‍ය ආයතනයකින් බැහැර කරනු ලබන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා එසේ බැහැර කරනු ලබන එක් එක් කිලෝ එකකට රුපියල් 50.00 බැගින් ගෙවිය යුතු ය.

2 වන කොටස

කිසියම් සංචාරක හෝටලයක් වන විට, ඒ සංචාරක හෝටලයෙහි කාමර සංඛ්‍යාව මෙහි පහත 1 වන තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක, ඒ එක් එක් සංචාරක හෝටලය විසින් එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ මාසික ගාස්තුවක් ගෙවිය යුතු ය.

| | *I* වන තීරුව<br>කාමර ප්‍රමාණය | *II* වන තීරුව<br>මාසික ගාස්තුව<br>*රුපියල්* |
|---|---|---|
| 1. | කාමර 3 කට නොඅඩු ස්ථානයක | 1,500 0 |
| 2. | කාමර 3 කට වැඩි එහෙත් කාමර 5කට වැඩි නොවන ස්ථානයක | 3,000 0 |
| 3. | කාමර 5 කට වැඩි එහෙත් කාමර 10කට වැඩි නොවන ස්ථානයක | 5,000 0 |
| 4. | කාමර 10 කට වැඩි එහෙත් කාමර 20කට වැඩි නොවන ස්ථානයක | 10,000 0 |
| 5. | කාමර 20 කට වැඩි එහෙත් කාමර 50කට වැඩි නොවන ස්ථානයක | 15,000 0 |
| 6. | කාමර 50 කට වැඩි එහෙත් කාමර 100කට වැඩි නොවන ස්ථානයක | 30,000 0 |
| 7. | කාමර 100 කට වැඩි එහෙත් කාමර 200ට වැඩි නොවන ස්ථානයක | 100,000 0 |
| 8. | කාමර 200කට වැඩි එහෙත් කාමර 300කට වැඩි නොවන ස්ථානයක | 200,000 0 |

## තංගල්ල ප්‍රාදේශීය සභාව

### සේවා සඳහා ගාස්තු නියම කිරීම

තංගල්ල ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 17 වන දින පවත්වනු ලැබූ රැස්වීමේ තීරණ අංක 5.0 (ix) යටතේ පහත දැක්වෙන යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 25 වැනි දින,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙන් තංගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටු කරනු ලබන පහත සඳහන් පොදු උපයෝගී සේවා, සුභසාධන සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේදී අවශ්‍ය කරන සේවා සැපයීමේදී 2019 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට විය යුතු යයි එකී ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

**උපලේඛනය**

| | *සේවාව* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| I. | නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | 250 0 |
| II. | වීථි රේඛා හා ගොඩනැගිලි සීමා සහතිකයක් ලබා ගැනීම | 260 0 |
| III. | පෞද්ගලික ජල සබඳතා ලබා ගැනීම සඳහා පාර පළුදු කිරීම | |
| | ජලය ගැනීම සඳහා 450 x 450 x 600 ප්‍රමාණයේ වලක් කැපීම සඳහා | 450 0 |
| | බොරළු මාර්ගය දිගේ කැපීම (මී. 1කට) | 130 0 |
| | මාර්ගය හරහා කැපීම (Con/grave/tar) | 528 0 |
| | කොන්ක්‍රීට් හෝ තාර මාර්ගයක් හරහා සම්පූර්ණයෙන් පළුදු කර ජලය ලබා ගැනීම | 2797 53 |
| | කොන්ක්‍රීට කුට්ටි ගල් ඇතිරූ මාර්ගයක් හරහා සම්පූර්ණයෙන් පළුදුකර ජලය ලබා ගැනීම | 1428 0 |
| IV. | සභාව සතු වාණිජ භූමි වෙන් කිරීම (දිනකට) | 1000 0 |
| VII. | ක්‍රීඩාංගන වෙන් කිරීම | |
| | අ) සංගීත සංදර්ශනයක් හෝ අවසරලත් සැණකෙළියක් සඳහා දිනකට | 1,000 0 |
| | (ආ) ක්‍රීඩා උත්සව හෝ වෙනත් කටයුත්තක් සඳහා දිනකට | 500 0 |
| | (ඇ) ඉහත සෑම අවස්ථාවකදීම ක්‍රීඩාංගනයට සිදුවිය හැකි අලාභ අයකර ගැනීමට, ක්‍රීඩාංගනය වෙන් කරවා ගන්නා අවස්ථාවේදී ගෙවිය යුතු ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල | 1,000 0 |

(ඈ) ඉහල (අ) සහ (ආ) හි සඳහන් යම් අවස්ථාවක දී ක්‍රීඩා භූමිය වෙන් කර ගන්නා දිනකට පෙර දිනයේ සවස් කාලය, පූර්ව සූදානම් වීම සඳහා අවශ්‍ය වන්නේ නම් ඒ අවස්ථාවට දිනකට අදාළ ගාස්තුවෙන් අඩක් ගෙවා වෙන් කර ගත යුතුය. එසේ වුව ද එසේ අවශ්‍ය වන දිනයේ වෙනත් තැනැත්තෙකු විසින් ක්‍රීඩා භූමිය වෙන්කර නොමැති විට පමණක් මෙම පහසුකම් සැපයිම කරනු ඇත.

| | | |
|---|---|---|
| VI. | ප්‍රජා ශාලාව/සම්මන්ත්‍රණ ශාලාව වෙන් කිරීම (දිනකට) | *රු. ශත* |
| | (අ) ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම් සහිතව | 1,500 0 |
| | (ආ) ශබ්ද විකාශන යන්ත්‍ර, ප්‍රොජෙක්ටරය හා තිර පහසුකම් සහිතව | 2,000 0 |

| | | රු. ශත |
|---|---|---|
| (ඇ) | ශබ්ද විකාශන යන්ත්‍ර පහසුකම් රහිතව | 1,000 0 |
| (ඈ) | ඉහත කුමන අවස්ථාවකදී හෝ ශාලාවට සිදුවිය හැකි අලාභ අයකර ගැනීමට, ශාලාව වෙන් කරවා ගන්නා අවස්ථාවේදී ගෙවිය යුතු ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල | 1,500 0 |
| (ඉ) | ඉහළ (අ) සහ (ආ) හි සඳහන් යම් අවස්ථාවකදී ශාලාව වෙන්කර ගන්නා දිනකට පෙර දිනයේ සවස් කාලය, පූර්ව සූදානම් වීම සඳහා අවශ්‍ය වන්නේ නම් ඒ අවස්ථාවට දිනකට අදාළ ගාස්තුවෙන් අඩක් ගෙවා වෙන්කර ගත යුතුය. එසේ වුවද එසේ අවශ්‍ය වන දිනයේ වෙනත් තැනැත්තකු විසින් ශාලාව වෙන්කර නොමැති විට පමණක් මෙම පහසුකම් සැපයීම කරනු ඇත. | |

ඉහත ගාස්තුවලට (ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් හැර) අමතරව රජයේ අනුමත බදු මුදල් අය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| VI. | පුස්තකාල සාමාජික අයදුම්පතක් සඳහා | 100 0 |
| VII. | පුස්තකාල දඩ දිනකට (එක් කාඩ්පතක් සඳහා) | 02 0 |
| VIII. | පුස්තකාල පොත් අස්ථානගත වීමේදී | පොතේ මිලෙන් 25% |
| IX. | ගොඩනැගිලි අයදුම්පතක් සඳහා | 500 0 |
| X. | අනුබෙදුම් අයදුම්පතක් සඳහා | 500 0 |
| XI. | ගොඩනැගිලි ඉදිකිරීම් අනුමත කාලය දීර්ඝ කිරීම (එක් වර්ෂයක් සඳහා) | 400 0 |
| XII. | අනතුරුදායක ගස් පැමිණිලි අයදුම්පතක් සඳහා | 200 0 |
| XIII. | ප්‍රචාරණ කටයුතු සඳහා සභාව සතු භූමිය වෙන්කරවා ගැනීම (දිනකට) | 1,000 0 |
| XIV. | ප්‍රචාරණ කටයුතු සඳහා සභාව සතු භූමිය තුළ තාවකාලික වෙළෙඳ කුටි ඉදිකර වෙන් කරවා ගැනීමට (දිනකට) | 1,500 0 |
| XV. | ඡායා පිටපත් A4 කඩදාසිය එක් පැත්තක් සඳහා | 1 50 |
| XVI. | ඡායා පිටපත් A4 කඩදාසිය දෙපැත්තක් සඳහා | 02 0 |
| XVII. | පෙර පාසල් අයදුම් පත්‍ර ගාස්තු | 100 0 |
| XIX. | දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු | |
| (අ) | ඇතුළත් කිරීමේ ගාස්තු | 200 0 |
| (ආ) | වයස අවුරුදු 1-2 දක්වා ළමුන් සඳහා | 3,500 0 |
| (ඇ) | වයස අවුරුදු 3-4 දක්වා ළමුන් සඳහා | 3.000 0 |
| (ඈ) | වයස අවුරුදු 4ට වැඩි ළමුන් සඳහා | 2,500 0 |
| | මසකට දින 10ට වඩා අඩුවෙන් පැමිණෙන සෑම දරුවකු සඳහාම දිනකට රු. 300,000 බැගින් අය කෙරේ. | |
| XX. | යන්ත්‍රෝපකරණ කුළියට ලබා දීම | |
| (අ) | බැකෝ යන්ත්‍රය කුළියට ලබා ගැනීම (පැයකට) | 2,200 0 |
| (ආ) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුළියට ලබා ගැනීම (පැයකට) | 4,500 0 |
| (ඇ) | ජල බවුසරය කුළියට ලබා ගැනීම (ලීටර් 4,000) | 2,500 0 |
| (ඈ) | ජල බවුසරය කුළියට ලබා ගැනීම (ලීටර් 5,500) | 3,000 0 |
| (ඉ) | ගල් රෝල කුළියට ලබා ගැනීම (පැයකට) | 3,500 0 |
| (ඊ) | ගල් රෝල ප්‍රවාහනය සඳහා (කි.මී. 15ක් දක්වා) | 2,500 0 |
| | ඊට වැඩිවන සෑම කි.මී. 1ක් සඳහා | 125 0 |
| (එ) | ට්‍රැක්ටර් රථය කුළියට ලබා ගැනීම (දවසට) | 5,000 0 |
| (ඒ) | ටිපර් රථය කුළියට ලබා ගැනීම (දවසට) | 8,000 0 |
| XXI. | මෘත දේහයක් භූමදානය සඳහා (සොහොන්වල ඉදිකිරීම හෝ කොන්ක්‍රීට් ඇතිරීමෙන් තොරව) | 500 0 |
| XXII. | මෘත දේහයක් භූමදානය සඳහා (සොහොන්වල ඉදිකිරීම හෝ කොන්ක්‍රීට් ඇතිරීම සහිතව) | 8,000 0 |
| XXIII. | සුසාන භූමියක සිහිවටන ඵලක ඉඩකඩක් තුළ හස්මාව ශේෂ තැන්පත් කිරීම සඳහා | |
| (අ) | සුසාන භූමියේ 2’ X 2’ ප්‍රමාණයේ භූමියේ ඉඩකඩක් තුළ | 1,000 0 |
| XXIIV. | සුසාන භූමියේ කලින් පිහිටුවන ලද සිහිවටන ඵලක ඉඩකඩක් තුළ තවත් ඥාතියකුගේ හස්මාව ශේෂ තැන්පත් කිරීම සඳහා (මෙම පහසුකම කිසියම් මෘත දේහයක් භූමදනය කරන ලද ස්ථිරව ඉදි කළ සොහොන් කුටියක් සඳහා ලබා දෙනු නොලැබේ) | 250 0 |

XXV. හුම්මානය පාරිසරික මධ්‍යස්ථානය සඳහා ඇතුළුවීම

| | | රු. ශ |
|---|---|---|
| (අ) | නිල ඇඳුමෙන් පැමිණෙන පාසල් ළමුන් සඳහා | 10 0 |
| (ආ) | වයස අවුරුදු 6ට වැඩි 12ට අඩු දරුවන් සඳහා (දේශීය) | 10 0 |
| (ඇ) | වයස අවුරුදු 12ට වැඩි අය සඳහා (දේශීය) | 20 0 |
| (ඈ) | වයස අවුරුදු 6ට වැඩි 12ට අඩු දරුවන් සඳහා (විදේශීය) | 150 0 |
| (ඉ) | වයස අවුරුදු 12ට වැඩි අය සඳහා (විදේශීය) | 250 0 |

වයස අවුරුදු 6ට අඩු දරුවන් සඳහා ගාස්තු අය නොකෙරේ.

09 - 709/9

---

## ආගරපතන ප්‍රාදේශීය සභාව

### ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව කසල බඳු පැනවීමේ නිවේදනය - 2019

ආගරපතන ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ ජූලි මස 13 වැනි දින තීරණ අංක 05.01.11 තීරණය යටතේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 2016.08.12 දිනැති *ගැසට්* නිවේදනයට අනුව 1952 වර්ෂයේ අංක 06 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන්ට අනුව පහත සඳහන් උපලේඛනය යටතේ කසල බඳු පැනවීම ට තීරණය කර ඇත.

සුබ්‍රමනියම් කදිර්වෙල්වන්,
සභාපති,
ආගරපතන ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආගරපතන ප්‍රාදේශීය සභාව,
2018 අගෝස්තු මස 06 වැනි දින.

**මාසික අය කිරීම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වගන්තිය ප්‍රකාරව**

| අංකය | කසල වර්ගය | | කිලෝ ග්‍රෑම් 50 රු. | කිලෝ ග්‍රෑම් 30 - 40 රු. | කිලෝග්‍රෑම් 20-30 රු | කිලෝග්‍රෑම් 10 - 20 රු. | කිලෝග්‍රෑම් 10 රු. | පොදු |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගෙවත්තේ මියගිය සතෙක් | 08 (II) | 1,000.00 | 800.00 | 500.00 | 250.00 | 200.00 | |
| 2 | ව්‍යාපාරික ස්ථාන සහ කාර්යාල | 11 (IV) | 1,000.00 | 800.00 | 500.00 | 250.00 | 200.00 | |
| 3 | හෝටල් | 12 (V) | 5,000.00 | 2,500.00 | 2,000.00 | 1,000.00 | 500.00 | |
| 4 | එළවළු, පළතුරු කඩ | 13 (III) | 2,000.00 | 1,000.00 | 500.00 | 300.00 | 200.00 | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | මස්, මාළු, කුකුල් මස් බිත්තර විකුණුම් ස්ථාන | 14 (III) | 1,000.00 | 800.00 | 500.00 | 250.00 | 200.00 | |
| 6 | පදික වෙළෙඳම්/ තාවකාලික වෙළඳම් | 15 (VI) | | | | | | 1000.00 |
| 7 | කර්මාන්තශාලා | 16 (II) | 2,000.00 | 1,000.00 | 500.00 | 250.00 | 200.00 | |
| 8 | උත්සව/ ඉදිකිරීම්/ කඩා ඉවත් කිරීම්/ට්‍රැක්ටර් රථයෙන් බහලන | 17 (II) | | | | | | 2,500.00 |
| 9 | තේ කඩ, සිල්ලර කඩ | 20 (II) | 1,000.00 | 500.00 | 250.00 | 200.00 | 100.00 | |
| 10 | බෙහෙත් ශාලා | 19 (II) | 1,000.00 | 500.00 | 250.00 | 200.00 | 100.00 | |

09-809/1

---

## ආගරපතන ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු - 2019

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2019 වසරේ ප්‍රචාරක දැන්වීම් බලපත්‍ර ගාස්තු අය කිරීම් යටතේ පහත සඳහන් පරිදි පැනවිය යුතු බවට 2018 ජූලි මස 13 වැනි සභා තීරණ අංක 05.01.12 යටතේ පහත සඳහන් කරුණු සඳහා ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බව මහජනතාවගේ දැන ගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

සුබ්‍රමනියම් කදිර්වෙල්වන්,
සභාපති,
ආගරපතන ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආගරපතන ප්‍රාදේශීය සභාව,
2018 අගෝස්තු මස 06 වැනි දින.

**තීරණය**

මධ්‍යම පළාතේ පළාත් සභා විෂය භාර අමාත්‍යතුමා විසින් සකස් කරන ලද 1988.08.23 දිනැති 520/7 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ අතුරු* ව්‍යවස්ථාවේ ප්‍රචාරක දැන්වීම් සහ නැරඹුම් පරිසරය සම්බන්ධව අතුරු ව්‍යවස්ථාව පිළිගෙන ක්‍රියාත්මක කිරීම සඳහා 2018.07.13 වැනි දින පැවති සභා රැස්වීමේ දී ඒකමතිකව සභාව පිළිගෙන එම අතුරු ව්‍යවස්ථාව අනුව ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ යොදන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් උපලේඛනයේ සඳහන් ගාස්තු අය කිරීමට ආගරපතන ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

ප්‍රචාරක දැන්වීම් සඳහා බලපත්‍ර ගාස්තු - 2019

1. මසකට වැඩි මාස තුනකට අඩු කාල සීමාවකට බැනර්, කටවුට්, දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියක් සඳහා - 30.00
2. ස්ථිර දැන්වීමක් සඳහා වසරක කාලයක් සඳහා වර්ග අඩියකට - රු. 150.00
3. තාවකාලික දැන්වීම් පුවරුවක් සඳහා මාසයක කාලයක් සඳහා වර්ග අඩියක් සඳහා රු. 75.00

09-809/2

---

## ආගරපතන ප්‍රාදේශීය සභාව

### 2016 වසරේ අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත

ආගරපතන ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 13 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 05.1.5 අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් නියෝගය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව මහජනතාවගේ දැනගැනීම පිණිස නිවේදනය කරනු ලැබේ.

සුබ්‍රමනියම් කදිර්වෙල්වන්,
සභාපති,
ආගරපතන ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආගරපතන ප්‍රාදේශීය සභාව,
2018 අගෝස්තු මස 06 වැනි දින.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා වලට පැවරී ඇති බලකල යටතේ ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තක්සේරු බදු සම්බන්ධව යම්කිසි නිවසක, ගොඩනැගිල්ලක, ඉඩමක, කුලී නිවසක වාර්ෂික වටිනාකම මිල තක්සේරු කටයුත්තක් හෝ අක්කර බදු සම්බන්ධව, යම්කිසි වගා ඉඩමක ඉඩම් අනුබෙදුමක් සඳහා වටිනාකම තක්සේරු කර ගැනීමට අදාල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනයක් සම්බන්ධව ව්‍යාපෘතිය පහසු කිරීමක් සහ 5 වගන්තියේ ප්‍රකාරව යම්කිසි දේපලක හිමිකරුට සහ වාසය කරන අයට එය බදු සහ එය අනුබෙදුම් කිරීම සම්බන්ධව තොරතුරු දැන ගැනීමට වාර්තාවක් ලබාදිය යුතු බවට ආගරපතන ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

09 - 809/3

## ආගරපතන ප්‍රාදේශීය සභාව

### වාහන නවතා තැබීම සඳහා ගාස්තු අය කිරීම - 2019

ආගරපතන ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 13 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 05.1.14 අනුව හා ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2019 වසරට වාහන නැවතුම් ගාස්තු පහත සඳහන් පරිදි අය කිරීමට තීරණය කර ඇත.

සුබ්‍රමනියම් කදිර්වෙල්වන්,
සභාපති,
ආගරපතන ප්‍රාදේශීය සභාව.

ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආගරපතන ප්‍රාදේශීය සභාව,
2018 අගෝස්තු මස 06 වැනි දින.

**තීරණය**

ආගරපතන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2019 වර්ෂය සඳහා වාහන නවතා තැබීමේ ගාස්තු පහත සඳහන් උපලේඛනයට අනුව පැනවීමට තීරණය කර ඇත.

***උපලේඛනය***

නවතා තැබීමේ ගාස්තු

| *වාහන වර්ගය* | *මාසික ගාස්තුව රු.* |
|---|---|
| ලොරි | 300.00 |
| වෑන් | 200.00 |
| ත්‍රිවීල් රථ | 100.00 |
| ට්‍රැක්ටර් සහ එන්ජින් | 100.00 |
| අත් ට්‍රැක්ටර් | 50.00 |

09 - 809/4

---

## ආගරපතන ප්‍රාදේශීය සභාව

### ගෝඝාතන ආඥාපනත (272)

ආගරපතන ප්‍රාදේශීය සභාව විසින් 2018 ජූලි මස 13 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ගන්නා ලද තීරණ අංක 05.1.09 අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව ගෝඝාතනය සඳහා ගාස්තු 2019 වසරට පහත සඳහන් පරිදි අයකිරීමට තීරණය කර ඇත.

සුබ්‍රමනියම් කදිර්වෙල්වන්,
සභාපති,
ආගරපතන ප්‍රාදේශීය සභාව.

2018 අගෝස්තු මස 06 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
ආගරපතන ප්‍රාදේශීය සභාව,

**උපලේඛනය**

ගෝඝාතනාගාරය පවත්වාගෙන යාම සඳහා වාර්ෂිකව රු. 1000.00

එක් එළුවෙක් ඝාතනය කිරීම සඳහා රු. 1000.00

එක් ගවයෙක් ඝාතනය කිරීම සඳහා රු. 1000.00

09 - 809/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.